පනත් කෙටුම්පත් වල වලංගුභාවය සහ ව්‍යවස්ථාදායක ක්‍රියාවලිය සම්බන්ධයෙන් ප්‍රශ්න කළ නොහැකි බව.

**124.** යුක්තිය පසිඳලීම සඳහා ඇතිකොට පිහිටුවන ලද කිසිම අධිකරණයකට, විනිශ්චය අධිකාරයකට හෝ වෙනත් කිසිම ආයතනයකට, තැනැත්තකුට හෝ පුද්ගල මණ්ඩලයකට, 120 වන, 121 වන සහ 122 වන ව්‍යවස්ථාවල විධිවිධාන සලසා ඇති පරිදි හැර කවර හෝ හේතුවක් නිසා, යම්කිසි පනත් කෙටුම්පතක ව්‍යවස්ථානුකූල භාවය පිළිබඳව හෝ ඒ පනත් කෙටුම්පත ව්‍යවස්ථාදායක ක්‍රියාවලියට අනුකූලවීම පිළිබඳව හෝ විමසීමට හෝ ඒ පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට, බලය හෝ අධිකරණ බලය නොමැත්තේ ය.

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව අර්ථ නිරූපණය කිරීම සම්බන්ධයෙන් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා අධිකරණ බලය.

**125.** (1) ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව අර්ථ නිරූපණය කිරීම පිළිබඳ යම් ප්‍රශ්නයක් විභාග කොට තීරණය කිරීම සඳහා තනි හා අනන්‍ය අධිකරණ බලය ශ්‍රේෂ්ඨාධිකරණයට ඇත්තේ ය. ඒ අනුව වෙනත් යම් අධිකරණයක හෝ විනිශ්චය අධිකාරයක හෝ යුක්තිය පසිඳලීම සඳහා හෝ අධිකරණ කාර්ය නැතහොත් අර්ධ අධිකරණ කාර්ය ඉටු කිරීම සඳහා හෝ නීතියෙන් බලය පැවරී ඇති වෙනත් යම් ආයතනයක හෝ නඩු කටයුතුවල දී එවැනි යම් ප්‍රශ්නයක් උද්ගත වුවහොත් ඒ ප්‍රශ්නය තීරණය කිරීම සඳහා නොපමාව ශ්‍රේෂ්ඨාධිකරණය වෙත යොමු කළ යුත්තේ ය. ඒ ප්‍රශ්නය සම්බන්ධයෙන් තීරණයක් කරන තෙක් වැඩිදුර නඩු කටයුතු අත්හිටුවන ලෙස ශ්‍රේෂ්ඨාධිකරණය විසින් විධාන කළ හැක්කේ ය.

(2) යොමු කරනු ලැබූ දින සිට මාස දෙකක් ඇතුළත ශ්‍රේෂ්ඨාධිකරණය විසින් එම ප්‍රශ්නය තීරණය කොට අවස්ථානුකූලව අවශ්‍ය විය හැකි යම් ආනුෂංගික ආඥා ද කළ යුත්තේ ය.

මූලික අයිතිවාසිකම් පිළිබඳ අධිකරණ බලය සහ ඒ බලය ක්‍රියාත්මක කිරීම.

**126.** (1) III වන පරිච්ඡේදයෙන් හෝ IV වන පරිච්ඡේදයෙන් හෝ ප්‍රකාශ කොට පිළිගන්නා ලද යම් මූලික අයිතිවාසිකමක් නැතහොත් භාෂා අයිතිවාසිකම යම් විධායක හෝ පරිපාලන ක්‍රියාවක් මගින් කඩ කිරීම හෝ කඩ කිරීමට අත්‍යාසන්නව පැවතීම හා සම්බන්ධ කවර වූ හෝ ප්‍රශ්නයක් විභාග කොට තීරණය කිරීමේ තනි හා අනන්‍ය අධිකරණ බලය ශ්‍රේෂ්ඨාධිකරණයට ඇත්තේ ය.

(2) තමාට සම්බන්ධ එවැනි යම් මූලික අයිතිවාසිකමක් නැතහොත් භාෂා අයිතිවාසිකම යම් විධායක ක්‍රියාවක් මගින් හෝ පරිපාලන ක්‍රියාවක් මගින් කඩ කොට ඇති බවට හෝ කඩ කිරීමට අත්‍යාසන්නව පවතින බවට යම් තැනැත්තකු විසින් දෝෂාරෝපණයක් කරනු ලබන අවස්ථාවක ඔහු විසින් ම නැතහොත් ඔහු වෙනුවෙන් පෙනී සිටින නීතිඥවරයකුගේ මාර්ගයෙන්, එතැන් පටන් මාසයක් ඇතුළත, එම කඩ කිරීමෙන් සහනයක් හෝ පිහිටක් ලබා දෙන ලෙස ශ්‍රේෂ්ඨාධිකරණයෙන් අයැද සිටින ඉල්ලීමක්, තත්කාලයේ බලපවත්නා අධිකරණ රීතිවලට අනුකූලව ශ්‍රේෂ්ඨාධිකරණය අමතා ඉදිරිපත් කරන ලිඛිත පෙත්සමක් මගින් කළ හැක්කේ ය. එවැනි ඉල්ලීමක් පිළිබඳව ක්‍රියා කිරීමට ශ්‍රේෂ්ඨාධිකරණයෙන් පූර්ව අවසරයක් ලබා ගැනීමෙන් පසුව පමණක් එවැනි ඉල්ලීමක් පිළිබඳව ක්‍රියා කරගෙන යා හැක්කේ ය. එසේ අවසරය ඉල්ලා සිටි විට අවස්ථාවෝචිත පරිදි ඒ අවසරය ප්‍රදානය කිරීම හෝ අවසරය දීම ප්‍රතික්ෂේප කිරීම හෝ විනිශ්චයකාරවරයන් දෙදෙනකුට නොඅඩු සංඛ්‍යාවක් විසින් කළ හැක්කේ ය.